පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/156/2020 (NPC)

ආරියපාල විජේසිංහ

**අභියාචක**

**එදිරිව**

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

වගඋත්තරකරු

**දිනය :- 2025.06.03**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)

ජේ.ජේ.රත්නසිරි (සාමාජික)

එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක සිටී,

අභියාචක වෙනුවෙන් නීතිඥ කේ.ඩී.ප්‍රනාන්දු මයා.

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂක ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

දෙපාර්ශවයම ඔවුනොවුන්ගේ කරුණු වාචිකව ඉදිරිපත් කරන ලදි. දෙපාර්ශවයම විසින් ලිඛිතව ද ඔවුන්ගේ දේශන ඉදිරිපත් කර ඇත. එකී ඉදිරිපත් වූ ලේඛන හා දේශන ඇතුළු, අදාළ වන සියලු කරුණු වලට අවධානය යොමු කර පහත නියෝගය ප්‍රකාශයට පත්කරමි..

### -<u>නියෝගය</u>-

දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිපතිවරයා විසින්, 2014.08.10 දිනැති ලේඛනය මගින්, මෙම අභියාචක වෙත චෝදනා 03ක් ඇතුළත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා 03 සම්බන්ධයෙන් පිළිතුරු ලබාදීම අභියාචක විසින් ඔහුගේ 2014.10.20 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇත. ඒ මගින් අභියාචක අදාළ චෝදනා වලට වරද පිළිගෙන ඇත. එසේ වරද පිළිගැනීම මත ඔහුගේ එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමට විනය නියෝගයක් නිකුත්

කර ඇත. එකී විනය නියෝගය 2014.12.20 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත දන්වා ඇත. එමඟින් රුපියල් තිස් දහසක (රු.30,000/=ක) මුදලක් අභියාචකගෙන් අයකර ගැනීමට තීරණය කර ඇතත්, පසුව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 29/2011 යටතේ අභියාචක වෙත එම මුදල ආපසු ගෙවා ඇත. ඒ අනුව අභියාචක වෙත ලබාදී ඇති එකී දඬුවම වන්නේ, ඔහුගේ එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමයි. අභියාචකගේ ඉල්ලීම වන්නේ එසේ පමුණුවන ලද දඬුවම ලිහිල් කර දෙන ලෙසයි. අභියාචක විසින් මෙම ඉල්ලීම කරනු ලබන්නේ එම දඬුවම නිසා ඔහුගේ ඉදිරි උසස්වීම් සියල්ල අත්හිටුවීයාම හේතුවෙනි.

අභියාචක ප්‍රථම අවස්ථාවේ දීම චෝදනා සම්බන්ධයෙන් වරද පිළිගැනීමක් කර ඇති නිසා, එම කරුණු සළකා බලා අඩු දඬුවමක් ලබාදීම පිළිගත් කරුණකි. කෙසේ වෙතත් ඉදිරිපත් කර තිබූ චෝදනා අනුව දැනටමත් එසේ ලිහිල් දඬුවමක් ලබා දී තිබේ නම්, මෙම අවස්ථාවේ දී ඒවා නැවත සළකා බැලීමේ අවශ්‍යතාවයක් නැත.

එය එසේ තිබියදී, අභියාචක වෙත දඬුවම් පමුණුවා ඇති චෝදනා වලට පාදක වී ඇති සිද්ධිය සම්බන්ධයෙන් වන කරුණු සළකා බලන ලදි. චෝදනාව සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශනයේදී හෙළිදරව් වී ඇති කරුණු අනුව, අභියාචක සහ පොලිස් කොස්තාපල් 13496 අනිල් කුමාර නැමැති අය රාජකාරියේ යෙදී සිටින අවස්ථාවේ දි, ජගත් කුමාර රාජපක්ෂ යන අයට පහරදීමක් ඇතුළු වෙනත් හිරිහැර කර තිබී ඇති බව පෙනීයයි. මේ අවස්ථාවේ දී එකී රාජපක්ෂ යන අය විසින් මූලික පරීක්ෂණයේ දී ලබා දී ඇති සාක්ෂිය කෙරෙහි අවධානය යොමු කරන ලදි. ඔහු අවස්ථා දෙකකදී පොලිසියට ප්‍රකාශයන් කර ඇත. එම සාක්ෂි අනුව පැහැදිලි වන්නේ අභියාචක, ඔහු සමඟ රාජකාරියේ නියුතුව සිටි අනික් නිලධාරියාට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියාව සිටි බවයි. සාක්ෂිකරු වන රාජපක්ෂ එහිදී පවසා ඇත්තේ, එකී අනෙක් කණිෂ්ඨ නිලධාරියා විසින් ඔහුට පහරදීම කළ බවයි. ඒ අනුව මෙම අභියාචක විසින්, රාජපක්ෂ යන අයට පහරදීමක් කළ බවට සාක්ෂි ඉදිරිපත් වී නොමැත. ඒ හැරනු විට සාක්ෂිකරු වන රාජපක්ෂ යන අය පවසා ඇත්තේ, අභියාචක විසින් කරන ලද්දේ, ඔහු සමඟ රාජකාරියේ සිටි අනික් නිලධාරියා විසින් කරන ලද පහරදීම වැළැක්වීමට බවයි.

මෙවැනි තත්ත්වයක් යටතේ පෙනී යන්නේ පොලිස් නිලධාරීන් දෙදෙනා අතරින් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා වන මෙම අභියාචක, රාපක්ෂ යන අය වෙත පහරදීමකට එක එල්ලේම සහභාගී වී නොමැති බවයි.

මෙවැනි තත්ත්වයක් යටතේ නිලධාරීන් දෙදෙනාටම එකම විනය දඬුවමක් පනවා තිබීම සුදුසු බව පෙනී යන්නේ නැත. අනික් පොලිස් නිලධාරියාට ද පනවා ඇත්තේ වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම පමණි.

ඉහත කරුණු සළකා බලා, අභියාචක වෙත පනවා ඇති දඬුවම ලිහිල් කර දීම සුදුසු බව විනිශ්චය අධිකාරයේ මතයයි. අභියාචක වරද පිළිගැනීම මත වරදකරු කර ඇති නිසා,එම කරුණද සළකා බලමින් අභියාචක වෙත පනවා ඇති එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම යන දඬුවම වෙනුවට "**අවවාදයක් පැනවීම**" යන දඬුවම නියම කරමින් ඔහුට පනවා ඇති දඬුවම සංශෝධනය කරමු.

ඒ අනුව ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට, ඉහත කොන්දේසි වලට යටත්ව අවසර දෙමු.

අභියාචනයට ඉඩදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි.

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-